# කාන්ටියානු ඥානවිභාගය විඥානවාදයක්ද? යන්න පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***කඩවල වැවේ කල්‍යාණ හිමි[1]***

---

**සංක්ෂේපය**

**"මා දැනගන්නේ කුමක්ද?"**යන පැනය පදනම් කර ගනිමින් තමන්ට සමකාලීන හා පූර්වතමයන්ගේ ඥානවිභාගය පිළිබඳව පැවති මතවලට වඩාත් ප්‍රතිවරුද්ධ වූ නව්‍යතම මෙන්ම විප්ලවීය මතවාදයක් ඥාන විභාගය පිළිබඳව ඉමැනුවෙල් කාන්ට් (ක්‍රි ඃ ව 1724 - 1804) විසින් ඉදිරිපත් කරන ලදි. කොපර්නිකස් විද්‍යාව තුළ සිදු කළ විප්ලවයට සමාන විප්ලවයක් කාන්ට් දර්ශනය තුළ සිදු කළ හෙයින් ඔහු දර්ශනයේ කොපර්නිකස් ලෙස ද හඳුන්වා ඇත. ඔහු මනස තුළ ප්‍රාග් අනුභූතිකව පවත්නා ආකෘතීන් සමූහයක් තුළින් මිනිසා ලබන ඥානය සංශ්ලේෂී බව ඔප්පු කරවීය. මනස කේන්ද්‍ර කරගත් මෙම ඥානවිභාගීය ප්‍රවේශය විඥානවාදී සංකල්පයන් ගම්‍ය කරන්නේද යන්න විමසා බැලීම මෙහි අධ්‍යයන ගැටලුව වේ. කාන්ට් පෙන්වාදෙන පරිදි දැනුම ගොඩනගන්නේ මනස තුළ ඇති ප්‍රාග් ආනුභූතික ආකෘති හරහාය. සංවේද්‍යතා හා අවබෝධතා ආකෘතීන් තුළින් දැනුම ගොඩනැගීමේ ක්‍රම පටිපාටියේ දී විඥානයට සුවිශේෂ ස්ථානයක් හිමි වේ. එය අනුභූතිකරණ සංවිජානනය ලෙස පෙන්වා දී ඇත. එහි දී කාන්ට්, මෙතෙක් කල් බාහිර ලෝකය තුළ පැවති ආකෘති මනස තුළට යොමු කරයි. මෙනිසා ඥානය ගොඩනැගෙන්නේ විඥානය තුළ වන හෙයින් කාන්ටියානු ඥානවිභාගය සංස්ථාපක ඥානවිභාගය යන පාරිභාෂික ශබ්දයෙන් ද හඳුන්වා ඇති අයුරින් විඥානවාදී ස්වරූපයක් ගනී. නමුත් කාන්ට් භෞතික වස්තූන්හි නොපැවැත්මක් ද නොපිළිගනියි. වේද්‍ය හෙවත් ප්‍රකේවලතාව ලෙස ඔහු බාහිර ලෝකය හඳුන්වා දී ඇත. මෙනිසා මොහුගේ දර්ශනය විඥාණය හා භෞතිකය අතර පවත්නා ඉගැන්වීමක් දැයි අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වෙයි. කාලය හා අවකාශ නම් වූ සංවේද්‍යතා ආකෘතිය හා පදාර්ථ දොළහකින් යුත් අවබෝධ්‍යතා ආකෘතීන් පදනම් කරගෙන ප්‍රාග් අනුභූතික සංශ්ලේෂී ප්‍රස්තුත නිර්මාණය වී එය ඥානය වන අයුරු කාන්ට් පෙන්වා දී ඇත. කාන්ට් තම ඥාන විභාගීය සංදර්භය තුළ වඩාත් අවධානයට ලක් කරන්නේ මානසික අංශයයි. ඔහු පෙන්වා දෙන්නේ ආකෘති හරහා ප්‍රපංච ගොඩනැගෙන බවත් එය එම වස්තූන්ගේ යථා ස්වභාවය නොවන බවත්ය. වස්තූන්ගේ ස්ව ලක්ෂණයන්ගෙන් යුත් යථා ස්වභාවය ගම්‍යකර ගැනීමට විචාරය අවශ්‍ය වේ. නමුත් මිනිස් මනස ආකෘතීන්ගෙන් ආකුල වී ඇති නිසා එම යථා ස්වභාවය විශද නොවේ. පසුකාලීනව ෂොපන්හවර් වැනි දාර්ශනිනයන් බුදු දහම අනුව යමින් විචාරය යන්න සාධනය කරන අයුරු පෙන්වා දී ඇත . උක්ත කරුණු තුළින් පෙනී යන්නේ කාන්ට් තම ඥානවිභාගීය සංකල්පයන් තුළින් විඥානවාදී අදහස් සමුදායක් ගම්‍ය කරන බවයි. ඔහු විඥානයට ප්‍රධාන තැනක් ලබා දී ඇති නමුත් එයින් ඔහු විඥානවාදියෙකු යැයි නිගමනය කිරීම යුක්ති යුක්ත ද යන්න විමසා බැලිය යුතු බව මෙයින් නිගමනය කළ හැක.

**ප්‍රමුඛ පද- සංස්ථාපක ඥාන විභාගය, විඥානය, ප්‍රකේවලතාව, ප්‍රාග්අනුභූතික, සංවේද්‍යතා හා අවබෝධතා**

---

[1] දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, kadawalawewe1989@gmail.com